# බලන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

| | | |
|---|---|---|
| **ස්ථානය** | **:** | **බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව** |
| **දිනය** | **:** | **2014-12-29** |
| **වේලාව** | **:** | **පෙ.ව. 10.00** |

බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:**

| | | |
|---|---|---|
| 1. | ගරු සභාපති | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 2. | ගරු උප සභාපති | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 3. | නගර සභා ගරු මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා |
| 4. | නගර සභා ගරු මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. | නගර සභා ගරු මන්ත්‍රී | එම්.ටී.එම්.රූම් මැතිතුමා |
| 6. | නගර සභා ගරු මන්ත්‍රී | නිමල් කරුණාරත්න මැතිතුමා |
| 7. | නගර සභා ගරු මන්ත්‍රී | චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා |
| 8. | නගර සභා ගරු මන්ත්‍රී | එම්. ජේ. මලික්ෂා මැතිතුමා |

**සහභාගී නොවූ:**

| | | |
|---|---|---|
| 9. | නගර සභා ගරු මන්ත්‍රී | ඒ.අසංක විජය නිල්මිනි මැතිතුමා |

**නිලධාරී සහභාගීත්වය**

1. ලේකම් එම්. එච්. සීලවතී මිය

## 01 ආගම සිහි කිරීම:

රැස්වීමට පැමිණ සිටි සියලු දෙනා තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

## 02. පසුගිය සභා වාර්තාව සම්මත කිරීම

ගරු නාගරික මන්ත්‍රි නිමල් කරුණාරත්න මැතිතුමා විසින් පසුගිය සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට යෝජනා කරන ලද අතර, ගරු නාගරික මන්ත්‍රි එම්.ටී.එම්.රූම් මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

කියැවූ ලෙස සලකා එම වාර්තාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 03. පසුගිය මහා සභා වාර්තාව සමාලෝචනය කිරීම

මෙදින සභාවේදි සමාලෝචන දෙකක් ඉදිරිපත් කරන ලදී.

**1.** 2014.11.27 සභා වාර්තාවේ අංක 11:01:01 යටතේ ශ්‍රී ලංකා ධීවර සංස්ථාවේ වෙළඳසැලක් සඳහා අනුමැතිය ලබාදීමට ගරු සභාවට යෝජනා කිරීම යටතේ ගරු නාගරික මන්ත්‍රි ධර්මසේන

සමරසිංහ මන්ත්‍රිතුමා ප්‍රකාශ කරන ලද බවට සදහන් කරන ලද ඉරිදා පොලේ මස්, මාළු. එළවළු විකිණීම සදහා ගරු සභාපතිතුමා ගෙනා අතුරු ව්‍යවස්ථා සංශෝධන යෝජනාවට තම සහයෝගය ලබාදෙන බවට සදහන් කිරීම **ඉරිදා පොලේ මස්, මාළු. එළවළු විකිණීමට හා ඉරිදා දිනයන්හි පමණක් පොළ පැවැත්වීමට සහයෝගය ලබාදෙන බවට සදහන් කිරීම ලෙස** සංශෝධනය කරන ලදී.

2. 2014.12.06 අයවැය සභා වාර්තාවේ ගරු උප සභාපති වසන්ත ගුණරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලද ඉතා වැදගත් කරුණු 3ක් අයවැය සම්බන්ධ විශේෂ සභා වාර්තාවේ සදහන් කර නැතැයි ගරු උප සභාපතිතුමා තම විරෝධතාවය දැක්වූ අතර එකී කරුණු 3 සමාලෝචන යටතේ පහත පරිදි ඉදිරිපත් කරන ලදී.
(1) එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රිවරුන්ට අයවැය සදහා විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලෙස එජාප මහලේකම් විසින් ලිඛිතව දන්වා තිබියදිත් එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රිවරුන් අයවැය සදහා පක්ෂව ඡන්දය ප්‍රකාශකිරීම පිළිබඳව ගරු උප සභාපතිතුමා ලෙස තමා සතුටුවන බව ප්‍රකාශ කිරීම සදහන් නොකිරීම.

(2) එක්සත් ජාතික පක්ෂ බලංගොඩ ආසනයේ විපක්ෂ නායක ,ගරු නාගරික මන්ත්‍රි ඒ.අසංක විජය නිල්මිනි මැතිතුමා අයවැය සදහා පක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමට සූදානමින් සිටි බව ගරු උප සභාපතිතුමා සමඟ ප්‍රකාශ කර සිටි බව සඳහන් නොකිරීම.

(3) ගරු උප සභාපතිතුමා අයවැය සඳහා පක්ෂව ඡන්දය ප්‍රකාශ කලද සභාපතිතුමන්ට රිසි පරිදි ඕනි ඕනි දේ කිරීම සදහා තමන් ඉඩ නොදෙන බව ප්‍රකාශ කිරීම සඳහන් නොකිරීම.

## 04. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන

මෙදින මහා සභා රැස්වීමට පැමිණ සිටි ගරු උප සභාපතිතුමන්, නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය සහ මාධ්‍යවේදීන් ඇතුළු සියළුම දෙනා ගරු සභාපතිතුමන් විසින් සාදරයෙන් පිළිගන්නා ලදී.
ගෙවී ගිය නත්තල සියළුම ක්‍රිස්තියානි භක්තිකයන්ට සුභ නත්තලක් වේවායි ප්‍රාර්ථනා කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා බව පැවසූ ගරු සභාපතිතුමා, ලබන්නා වූ 2015 වර්ෂය සාමය, සතුට පිරි සියළු දෙනාට එක වහලක් යට බියෙන් ,සැකෙන් තොරව ජීවත්වීමට හැකි වාසනාවන්ත සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරන ලදී.
අනතුරුව අදහස් දක්වමින් ගරු සභාපතිතුමා ඉදිරියේදී පැවැත්වීමට නියමිත මැතිවරණය තුළින් රටේ ජනාධිපතිතුමා තෝරාගැනීමට නියමිත බවත්, දශක 30 ක් තිස්සේ පැවති කුරිරු යුද්ධය නිමා කරමින් රට එක්සත් කල අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ජයග්‍රහණය කරවීම උදෙසා රටේ ජනතාව බුද්ධිමත් ලෙස ක්‍රියාකරනු ඇතැයි තමන් අපේක්ෂා කරන බවත් පැවසීය.

නගරයේ ජනතාවගෙන් එකතු කර ගන්නා බදු මුදලට වඩා බලන්ගොඩ නගර සභාව මගින් නගරය තුළ විශාල සංවර්ධන කාර්යය භාර්යයක් සිදුකර ඇති බව පැවසූ ගරු සභාපතිතුමා, අතිගරු ජනාධිපතිතුමා හඳුන්වා දුන් එක ගමකට එක වැඩක් ව්‍යාපෘතිය වැනි විවිධ ව්‍යාපෘතීන් යටතේ ලබා දුන් මුදල් ප්‍රතිපාදන ඔස්සේ 2014 වර්ෂයේදී දැවැන්ත සංවර්ධන කාර්යයන් රැසක් නිම කිරීම සඳහා හැකියාව ලැබුන බවද පවසන ලදී.

එමෙන්ම 2015 වර්ෂය තුළ සිදුකිරීමට අපේක්ෂිත සංවර්ධන කටයුතු රැසක් වෙනුවෙන් මේවන විටත් සැළසුම් සකස් කරමින් යන බව පැවසූ ගරු සභාපතිතුමා, ඉන් මූලික කරුණු කාර්යයන් ලෙස ක්‍රීඩා පිටිය සංවර්ධනය සදහා කෝටි 5ක මුදලක්ද,පොදු වෙළෙඳසැල සංවර්ධනය සදහා කෝටි 1.5 මුදලක්ද, කාර්පාක් එක සංවර්ධනය සදහා කෝටි 1ක මුදලක්ද, බැංකියවත්ත අපද්‍රව්‍ය අවසන් බැහැර කිරිමේ මධ්‍යස්ථානයේ අපද්‍රව්‍ය දහනය කිරීමේ උදුන සෑදිම සදහා ලක්ෂ 10 ක මුදලක්ද,ගරු නාගරික මන්ත්‍රි ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමාගේ ඉල්ලීමකට අනුව කිරිදිගල සේවා පියස සංවර්ධනය කිරිම සදහා ලක්ෂ 25 ක මුදලක්ද ප්‍රධාන තැනක් ගන්නා බව පැවසීය.එමෙන්ම නගරයේ සෞඛ්‍ය පහසුකම් හා නිවාස ආධාර ලබාදීම වෙනුවෙන් ලක්ෂ 20ක් පමණ මුදල් ප්‍රතිපාදන වෙන් කර ඇති බව පැවසූ ගරු සභාපතිතුමා බහුතර කැමැත්තෙන් සම්මත වූ 2015

අයවැය තුළින් සියල්ලන්ගේ යෝජනා දායකත්වයෙන් බලංගොඩ නගරයේ සංවර්ධන කාර්යයන් රැසක් සිදුකිරීමට අපේක්ෂා කරන බවද පවසන ලදී.

එමෙන්ම 2014 වර්ෂයේ සංවර්ධන කාර්යයන් සිදුකිරීම සඳහා සහයෝගය ලබාදුන් පක්ෂ විපක්ෂ සියළුම මන්ත්‍රිවරුන්ට ස්තුතිවන්ත වන බව පැවසූ ගරු සභාපතිතුමා 2015 වර්ෂය සංවර්ධනය කරා පියනගන ,සුභ නව වසරක් වේවායි පතමින් ගරු සභාවේ කාර්යයන් සාර්ථක ලෙස සිදු කර ගෙන යාමට අවශ්‍ය ශක්තිය ,ධෛර්යය සියළු දෙනාටම ලැබේවායි පවසමින් නිවේදන ප්‍රකාශ කිරීම අවසන් කරන ලදී.

## 05. පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම

පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණයන්හි ප්‍රගතිය හා කර්මාන්ත ප්‍රගතිය ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා සභා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම්.රූම් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 06. සභාවට ලැබී ඇති ලිපි/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම

### 06:01 බළන්ගොඩ බස් නැවතුම්පල ,උඩුමහල පිහිටි ඞී 22 දරණ කඩ කාමරය බදු අයිතිය වෙනස් කිරීම.

මහේස්වරන් සුජිත් කුමාර විසින් බළන්ගොඩ බස් නැවතුම්පල ,උඩුමහල පිහිටි ඞී 22 දරණ කඩ කාමරය බදු අයිතිය වෙනස් කර ඔහුගේ ඥාතියෙකු වන ඉන්දුක ලාල් ප්‍රසන්න සිල්වා යන අයට නීත්‍යානුකූලව අයිතිය පවරා දෙන මෙන් සභාවෙන් ඉල්ලීමක් කර තිබූ ලිපිය සභාව වෙත ඉදිරිපත් කර ගරු සභාපතිතුමා ,සභාවට අයවිය යුතු සියළු මුදල් අයකර එය පවරා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රි නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

### 06:02 2015 වර්ෂයේ සිට වරිපනම් බදු නිදහස් කිරීම.

2015 වර්ෂයේ සිට ඉදිරියට වරිපනම් බදු නිදහස් කිරීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සුදුසු බව සඳහන් කරමින් ආදායම් පරීක්ෂක මහතා විසින් සභාව වෙත ඉදිරිපත් කර තිබූ ලිපිය ගරු සභාව වෙත ඉදිරිපත් කල ගරු සභාපතිතුමා විසින් මේ පිළිබදව අවස්ථානුකූලව හා , සානුකම්පිතව සලකා බලා සභාව විසින් තීරණයක් ගැනීම සුදුසු බවට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රි එම්.ටී.එම්.රූම් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

### 06:03 2014 වර්ෂයේදි ආයුර්වේදයේ සිදුකල වැඩසටහන් පිළිබදව වාර්තාව

2014 ජනවාරි මස සිට සැප්තැම්බර් මස දක්වා නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව මගින් සිදුකරනු ලැබූ වැඩසටහන් පිළිබද ආයුර්වේද වෛද්‍ය නිළධාරිනිය විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව ගරු සභාපතිතුමා විසින් මහා සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

**06:04 බිල්පත් ප්‍රතිපූර්ණය කරනු ලබන දුරකථන අංකය වෙනස් කිරීම. ගරු සභාපති නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා**

ගරු සභාපති නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා විසින් බිල්පත් ප්‍රතිපූරණය කරනු ලබන දුරකථන අංකය වෙනස් කිරිම සඳහා කර තිබූ ලිපිය සභාව වෙත ඉදිරිපත් කල ගරු සභාපතිතුමා ජංගම දුරකථනය සඳහා බිල්පත් ගෙවිමට මහ සභාවේ අනුමැතිය දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රි එම්.ටී.එම්.රුැම් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

06:05 දැයට කිරුළ 2015 ජාතික සංවර්ධන වැඩසටහන - බළන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති

දැයට කිරුළ 2015 ජාතික සංවර්ධන වැඩසටහන යටතේ බළන්ගොඩ නගර සභාව මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත පහත සදහන් ව්‍යාපෘති ගරු සභාපතිතුමා විසින් මහ සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

(1) බලංගොඩ නගර සභා පිටිය නවීකරණය කිරීම - මිලියන 50

(2) බලංගොඩ පොදු වෙළෙඳ සැල නවීකරණය කිරීම - මිලියන 15

(3) කිරිදිගල වසමේ බහු කාර්යය ගොඩනැගිල්ල ඉදිකිරීම - මිලියන 2.5

(4) බලංගොඩ නගරයේ කාර්පාක් එක නවීකරණය කිරීම - මිලියන 10

(5) බලංගොඩ නගර සභාව විසින් පවත්වා ගෙන යන ලබන ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ දහන උදුන උදුන ඉදිකිරීම. මිලියන 01

**06:06 නගර සභාවේ ක්‍රියාත්මක කමිටු සදහා සාමාජිකයන් නම් කිරීම.**

නගර සභාවේ ක්‍රියාත්මක කමිටු සදහා 2015 වර්ෂයේ නව සාමාජිකයන් පත්කිරීම පහත පරිදි ඉදිරිපත් කරන ලදී.

**06:06:01 ඝන අපද්‍රව්‍ය කළමණාකරන කමිටුව**

| | | |
|---|---|---|
| 01 | කමිටුවේ ගරු සභාපති | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතතුමා |
| 02 | ගරු නාගරික මන්ත්‍රී | එම්. ටී. එම්. රුැම් මැතිතුමා |
| 03 | ගරු නාගරික මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා |
| 04 | ගරු නාගරික මන්ත්‍රී | එම්. ජෙ. මලීක්ෂා මැතිතුමා |
| 05 | ගරු නාගරික මන්ත්‍රී | අසංක විජය නිල්මිණී මැතිතුමා |
| 06 | ලේකම් | එම්. එච්. සීලවතී මහත්මිය |
| 07 | මහජන සෞඛ්‍ය පරීක්ෂක | නිමල් ප්‍රේමතිලක මහතා |
| 08 | සැලසුම් නිලධාරී | නාගරික සංවර්ධන අධිකාරිය |
| 09 | සෞ.වෛ.නි | බළන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය |
| 10. | පරිසර නිලධාරී | බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| 11. | ජ්‍යෙෂ්ඨ පුරවැසි | ටී. එච්. පූජදාස මහතා |

| | | |
|---|---|---|
| 12 | ජ්‍යෙෂ්ඨ පුරවැසි | ඒ. බී. එස් බණ්ඩාරවත්ත මහතා |
| 13. | පරිසර ක්‍රියාකාරිනී | කුසුමා අබේසිංහ මිය |
| 14. | 3 ආර් කමිටු සාමාජික | කුසුමා ජයසුන්දර මිය |
| 15 | 3 ආර් කමිටු සාමාජික | පත්මා හෙට්ටිආරච්චි මිය |
| 16. | සෞඛ්‍ය පරීක්ෂක | දර්ශා ජයසිංහ මහත්මිය |
| 17 | සංවර්ධන නිලධාරී | අනුෂා මල්කාන්ති මහත්මිය |

**06:06:01 ආපදා කළමණාකරන කමිටුව**

| | | |
|---|---|---|
| 01 | කමිටුවේ ගරු සභාපති | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 02 | ගරු නාගරික මන්ත්‍රී | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 03 | ගරු නාගරික මන්ත්‍රී | නිමල් කරුණාරත්න මැතිතුමා |
| 04 | ගරු නාගරික මන්ත්‍රී | එම්. ජෙ. මලීක්ෂා මැතිතුමා |
| 05 | ලේකම් | එම්. එච්. සීලවතී මහත්මිය |
| 06 | මහජන සෞඛ්‍ය පරීක්ෂක | නිමල් ප්‍රේමතිලක මහතා |
| 07 | වැඩ අධිකාරී | යූ. වී. දැල බණ්ඩාර මහතා |
| 08 | ආදායම් පරීක්ෂක | එස්. එම්. එස්. ආනන්ද මහතා |
| 09 | පොලිස් පරීක්ෂක | ජී. ඒ. එන් ජයසූරිය මහතා |
| 10 | පරිසර නිලධාරී | බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| 11 | කාර්මික නිලධාරී, විධායක ඉංජිනේරු කාර්යාලය | එම්. කේ. ජෙ. නිශ්ශංක මහතා |
| 12 | ජ්‍යෙෂ්ඨ පුරවැසි | ටී. එච්. පූජදාස මහතා |
| 13 | ජ්‍යෙෂ්ඨ පුරවැසි | ඒ. බී. එස් බණ්ඩාරවත්ත මහතා |
| 14 | පරිසර ක්‍රියාකාරිනී | කුසුමා අබේසිංහ මිය |
| 15 | ජ්‍යෙෂ්ඨ පුරවැසි | කවිරාජ ගුණතිලක මහතා |
| 14. | 3 ආර් කමිටු සාමාජික | කුසුමා ජයසුන්දර මිය |
| 15 | 3 ආර් කමිටු සාමාජික | පත්මා හෙට්ටිආරච්චි මිය |
| 16 | 3 ආර් කමිටු සාමාජික | ඩබ්. ටී. සිරිපාල මහතා |
| 17 | සංවර්ධන නිලධාරී | රසිකා සෙව්වන්දි මෙය |

**06:06:03:04:05 මුදල්,තානායම් හා ප්‍රසම්පාදන කමිටුව**

| | |
|---|---|
| 1. ගරු සභාපති | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 2. ගරු උප සභාපති | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 3 නගර සභා ගරු මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා |
| 4. නගර සභා ගරු මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |

| | |
|---|---|
| 5. නගර සභා ගරු මන්ත්‍රී | එම්.ටී.එම්.රූම් මැතිතුමා |
| 6. නගර සභා ගරු මන්ත්‍රී | නිමල් කරුණාරත්න මැතිතුමා |
| 7. නගර සභා ගරු මන්ත්‍රී | චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා |
| 8. නගර සභා ගරු මන්ත්‍රී | එම්. ජේ. මලික්ෂා මැතිතුමා |
| 9. නගර සභා ගරු මන්ත්‍රී | ඒ.අසංක විජය නිල්මිනි මැතිතුමා |
| 10. ලේකම් | එම්. එච්. සීලවතී මහත්මිය |
| 11. ගණකාධිකාරි | එම්.ඩී.එස්.ප්‍රනාන්දු මහතා |
| 12.ප්‍රධාන කළමණාකාර සහකාර | අමිතා කරුණාරත්න මහත්මිය |
| 13. වැඩසටහන් සහකාර | රජිත කොස්වත්ත |
| 14.කළමණාකාර සහකාර | කුමාර සෙනෙවිරත්න මහතා |
| 15. තානායම් ගබඩා භාරකරු | ඩියුක් ඩැනියෙල් මහතා |
| 16. තානායම් කළමණාකරු | ලහිරු වීරසිංහ මහතා |
| 17. සංවර්ධන නිළධාරි | අමිල මිහිරංග මහතා |

**06:06:06 කර්මාන්ත කමිටුව**

| | |
|---|---|
| 1. ගරු සභාපති | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 2. ගරු උප සභාපති | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 3. නගර සභා ගරු මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 4. නගර සභා ගරු මන්ත්‍රී | එම්.ටී.එම්.රූම් මැතිතුමා |
| 5. නගර සභා ගරු මන්ත්‍රී | නිමල් කරුණාරත්න මැතිතුමා |
| 6. ලේකම් | එම්. එච්. සීලවතී මහත්මිය |
| 7. ගණකාධිකාරි | එම්.ඩී.එස්.ප්‍රනාන්දු මහතා |
| 8. වැඩ අධිකාරි | යූ. වී. දැල බණ්ඩාර මහතා |
| 9. කාර්මික නිලධාරි | එස්.එච්.කේ.කරුණාරත්න මහතා |
| 10. සංවර්ධන නිලධාරි | ඩී.කේ.පී.රංජනි මහත්මිය |
| 11. සංවර්ධන නිලධාරි | ඒ.එම්.තක්ෂිලා අබේසිංහ මහත්මිය |
| 12. සංවර්ධන නිලධාරි | ආර්.ඒ.චන්දිමා රූපසිංහ මෙනෙවිය |
| 13. වැඩ පරිපාලක | ජී.හැරල්ඩ් විජිත මහතා |
| 14. ජ්‍යෙෂ්ඨ පුරවැසි | එන්.ඒ.තිස්සානන්ද මහතා |
| 15. ජ්‍යෙෂ්ඨ පුරවැසි | කේ.එන්.එස්.දයානන්ද මහතා |

**06:06:07 පුස්තකාල උපදේශන කමිටුව**

**06:07 2015 ක්‍රියාකාරි සැලැස්ම හා සිව් අවුරුදු සැලැස්ම අනුමත කර ගැනීම**

2015 ක්‍රියාකාරි සැලැස්ම හා සිව් අවුරුදු සැලැස්ම සඳහා වූ යෝජනා පෙළගැස්ම සභාව වෙත ඉදිරිපත්කල ගරු සභාපතිතුමා ඒ සඳහා අනුමැතිය ලබාදීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:08 2015 පුහුණු සැලැස්ම අනුමත කර ගැනීම.**

2015 වර්ෂය සඳහා වූ වාර්ෂික පුහුණු සැලැස්ම සභාව වෙත ඉදිරිපත්කල ගරු සභාපතිතුමා ඒ සඳහා අනුමැතිය ලබාදීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය

**06:09 2015 ඝන අපද්‍රව්‍ය කළමණාකරන සැලැස්ම අනුමත කර ගැනීම**

2015 වර්ෂය සඳහා වූ ඝන අපද්‍රව්‍ය කළමණාකරන ඒකකයේ පස් අවුරුදු සැලැස්ම සභාව වෙත ඉදිරිපත්කල ගරු සභාපතිතුමා ඒ සඳහා අනුමැතිය ලබාදීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය

**06:10 2015 වර්ෂය සඳහා මහ සභාව පවත්වන දින අනුමත කර ගැනීම.**

2015 වර්ෂය සඳහා මහ සභාව පවත්වන දින අනුමත කර ගැනීමේ ලිපිය මහ සභාව වෙත ඉදිරිපත් කල ගරු සභාපතිතුමා විශේෂ සිදුවීමක් නිසා වෙනස් කිරිමක් සිදුකිරිම හැරෙන්නට සෑම මසකම අවසන් සතියේ බ්‍රහස්පතින්දා දින මාසික සභාව පැවැත්වීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුම් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:11 කමිටු සඳහා 25%ක කාන්තා නියෝජනයක් ලබාගැනීම.**

නගර සභාව මගින් ක්‍රියාත්මක වන කමිටු සඳහා 2015 වර්ෂය වෙනුවෙන් සාමාජිකයන් පත් කිරීමේදි 25% කාන්තා නියෝජනයක් ලබා ගැනීමට අනුමැතිය පතමින් ඉදිරිපත් කර තිබූ ලිපිය ගරු සභාව වෙත ඉදිරිපත් කරමින් ගරු සභාපතිතුමා විසින් ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුම් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:12 නගර සභා දැක්ම හා මෙහෙවර අනුමත කර ගැනීම.**

බලංගොඩ නගර සභාවේ දැක්ම හා මෙහෙවර සඳහා අනුමැතිය අවශ්‍ය බව පවසමින් ඉදිරිපත් කර තිබූ ලිපිය ගරු සභාව වෙත ඉදිරිපත් කල ගරු සභාපතිතුමා විසින් ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූම් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:13 හිඟ කඩකුළී අයකර ගැනීම**

පොදු වෙළෙඳ සැල කඩ කාමර අංක 12,14 සහ 18/19 සඳහා අයවිය යුතු හිඟ මුදල් අය කරගැනීම සම්බන්ධයෙන් ගත යුතු ඉදිරි පියවර පිළිබඳ උපදෙස් පතමින් ඉදිරිපත් කර තිබූ ලිපිය ගරු සභාව වෙත ඉදිරිපත් කල ගරු සභාපතිතුමා හිඟ මුදල් අයකර ගත නොහැකි කඩ කාමර සඳහා නීත්‍යානුකූලව කටයුතු කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:14 2015 වර්ෂය සඳහා මහජන පොළ ආපන ශාලාව සඳහා කඩකුළිය තීරණය කිරීම.**

2015 මහජන පොළ ආපන ශාලාව සඳහා කඩකුළිය තීරණය කිරීමේදි ,තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු වටිනාකම දන්වන තෙක් රු.5000 දක්වා කඩ කුළිය අඩු කිරිමට සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූම් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:15 කාර්පාර්ක් කඩ කාමර ඉදිකිරීම සම්බන්ධ සාකච්ඡාවේ වාර්තාව**

කාර්පාර්ක් කඩ කාමර ඉදිකිරීම සම්බන්ධ සාකච්ඡාවේ වාර්තාව මහ සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කල ගරු සභාපතිතුමා කඩ කාමර අළුතින් ලබා දිමේදි පරණ කඩ කුළි හිමියන්ටම වැඩි කුළි පදනමක් යටතේ ලබා දීම සුදුසු බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූම් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:16 2015 වර්ෂයට සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන්ගේ නාමයෝජනාව අනුමැතියට ඉදිරිපත් කිරීම.**

බලංගොඩ නගර සභාව මගින් ඉදිරිපත් කරන ලද පුවත්පත් දැන්වීමට අනුව ලියාපදිංචි ගාස්තු ගෙවමින් 2015 වසරේ සැපයුම්කරුවන්ගේ සහ කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනය මහ සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කල ගරු සභාපතිතුමා ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

**බළන්ගොඩ නගර සභාවේ 2015 වර්ෂයේ සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචි වී ඇති ආයතනයන්ගේ සහ පුද්ගලයින්ගේ නාම ලේඛනය.**

| අනු අංකය | ආයතනයේ නම හා ලිපිනය | දුරකථන අංකය | මුදල් ගෙවූ ලදුපත් අංකය |
|---|---|---|---|
| **සැපයුම්කරුවන්** | | | |
| **01. කාර්යාල උපකරණ හා ලිපි ද්‍රව්‍ය සැපයීම** | | | |
| 01 | ජෝන් කීල්ස් ඔෆිස් ඔටෝමේෂන් පුද්ගලික සමාගම,<br>අංක 90,යුනියන් ප්ලේස්,කොළඹ 02. | 0112313000<br>0112431745 | 36375 |
| 02 | කෝල්ට් ට්‍රේඩින් කම්පැණි පුද්ගලික සමාගම,<br>අංක 241, ඩඩ්ලි සේනානායක මාවත, කොළඹ 08. | 0112667272<br>0112575934 | 37510 |
| 03 | රේන්බෝ ස්ටැෂනරීස් ඇන්ඩ් ඉලෙක්ට්‍රිකල්ස්,<br>අංක 33, පංචිකාවත්ත පාර, කොළඹ 10. | 0115641369<br>0723601789 | 37530 |
| 04 | ගෙස්ටේට්නර් ඔෆ් සිලෝන් පීඑල්සී,<br>අංක 248, වෝක්ෂෝල් වීදිය, කොළඹ 02 | 0112541351 | 36704 |
| 05 | ජෝති ස්ටෝර්ස්,<br>අංක 22, කෙළින් වීදිය, බළන්ගොඩ. | 0452287217 | 37470 |
| 06 | ප්‍රභා ශ්‍රී පොත්හල,<br>අංක 54 පී, පරණ පාර, බළන්ගොඩ. | 0711717414<br>0716125613 | 37462 |
| 07 | මෙට්‍රොපොලිටන් ඔෆිස් පුද්ගලික සමාගම,<br>අංක 578 ඒ, නව නගරය, රත්නපුර. | 0454920310 | 36990 |
| 08 | නෙක් ටෙක්නොලොජීස්,<br>අංක 82, නව නගරය, රත්නපුර. | 0452228162 | 36707 |
| 09 | පුබුදු පොත් හල,<br>අංක 62/1,පරණ පාර, බළන්ගොඩ. | 0727073707 | 37259 |
| 10 | නරාහ් කම්පියුටර් ෆෝම්ස්,<br>අංක 309/4සී, මීගමු පාර, වැලිසර. | 0112245700 | 37531 |
| 11 | නරාහ් ස්ටැෂනරීස්,<br>අංක 262, ගාලු පාර, කොළඹ 03. | 01123577995 | 37532 |
| 12 | පැස්කෝ සිලෝන් පුද්ගලික සමාගම,<br>අංක 19, ශාන්ත මයිකල් පාර, කොළඹ 03. | 0112343100 | 37533 |
| **02. වානේ භාණ්ඩ හා ලී බඩු සැපයීම** | | | |

| | | | |
|---|---|---|---|
| 13 | ඇල්ෆා ඉන්ඩස්ට්‍රීස් පුද්ගලික සමාගම,<br>අංක 49/16, අයිස්ලන්ඩ් ගොඩනැගිල්ල,<br>ගාලු පාර, කොළඹ 03. | 0114707707<br>0114707770 | 36729 |
| 14 | මෙට්‍රොපොලිටන් ඔෆිස් පුද්ගලික සමාගම,<br>අංක 578 ඒ, නව නගරය, රත්නපුර. | 0454920310 | 36990 |
| 15 | සෙනෙවි ස්ටෝර්ස්,<br>අංක 114, කල්තොට පාර, මිරිස්වත්ත, බළන්ගොඩ. | 0773387369<br>0779070762 | |
| 16 | ලකී ෆර්නිචර්ස් පුද්ගලික් සමාගම,<br>අංක 17, හරස් වීදිය, නුවර. | 0812224919 | 36445 |
| 17 | දිනපාල පුද්ගලික සමාගම,<br>අංක 883, පේරාදෙනිය පාර, මහනුවර. | 0812221540 | 36991 |
| 18 | කෝල්ට් ට්‍රේඩින් කම්පැණි පුද්ගලික සමාගම,<br>අංක 241, ඩඩ්ලි සේනානායක මාවත, කොළඹ 08. | 0112667272<br>0112575934 | 37510 |
| **03. පරිගණක, පරිගණක උපාංග හා මුද්‍රණ තීන්ත සැපයීම** | | | |
| 19 | රේන්බෝ ස්ටැෂනරීස් ඇන්ඩ් ඉලෙක්ට්‍රිකල්ස්,<br>අංක 33, පංචිකාවත්ත පාර, කොළඹ 10. | 0115641369<br>0723601789 | 37530 |
| 20 | ගෙස්ටෙට්නර් ඔෆ් සිලෝන් පීඑල්සී,<br>අංක 248, වෝක්ෂෝල් වීදිය, කොළඹ 02 | 0112541351 | 36704 |
| 21 | නෙක් ටෙක්නොලොජීස්,<br>අංක 82, නව නගරය, රත්නපුර. | 0452228162 | 36707 |
| 22 | ජාන් කම්පියුටර් සර්විසස්,<br>අංක 82, බාන්ස් රත්වත්ත මාවත, බළන්ගොඩ. | 0714902270<br>0452288457 | 37534 |
| 23 | නියුනෙට් කම්පියුටර් පුද්ගලික සමාගම,<br>අංක 850, කොළඹ පාර, හිදැල්ලන, රත්නපුර. | 0452228775<br>0452228784 | 37513 |
| 24 | ජෝන් කීල්ස් ඔෆිස් ඔටෝමේෂන් පුද්ගලික සමාගම,<br>අංක 90,යුනියන් ප්ලේස්,කොළඹ 02. | 0112313000<br>0112431745 | 36375 |
| 25 | බිසී ටෙක් ලංකා,<br>අංක ජී25/2/2,එබේ හේන,කහටගස් තැන්න,<br>රුවන්වැල්ල. | 0775663511 | 37100 |
| 26 | එවර්ග්‍රීන් ඔෆිස් ඔටෝමේෂන්,<br>අංක1/111,බණ්ඩාරනායක මාවත, රත්නපුර. | 0452230225 | 37505 |
| 27 | පී සී ග්ලෝබ් සිස්ටම්ස් පුද්ගලික සමාගම, | 0112301793 | 37511 |

| | | | |
|---|---|---|---|
| | අංක 38, වින්ස්ටෝන් ප්ලේස්, කොළඹ 03. | 0772441682 | |
| 28 | නරාහ් ස්ටැෂනරීස්,<br>අංක 262, ගාලු පාර, කොළඹ 03. | 01123577995 | 37532 |
| **04. ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍ය සැපයීම** | | | |
| 29 | ජේ.සී.හාඩ්වෙයාර්,<br>කල්තොටපාර, මිරිස්වත්ත, බළන්ගොඩ. | 0452289176 | 37263 |
| 30 | නිම්නා එන්ටර්ප්‍රයිසස් ඇන්ඩ් හාඩ්වෙයාර්,<br>අංක 141, හපුත්ලේ පාර, තුඹගොඩ, බළන්ගොඩ. | 0452288916<br>0777599001 | 37468 |
| 31 | ඒ.බී.එස් අමන්දා හාඩ්වෙයාර්,<br>බෲන්ස් රත්වත්ත මාවත, බළන්ගොඩ. | 0710856645 | 37618 |
| **05. මාර්ග නඩත්තු උපකරණ හා ද්‍රව්‍ය සැපයීම.** | | | |
| 32 | සෙනොක් ට්‍රේඩ් කම්බයින් පුද්ගලික සමාගම,<br>අංක 03, ආර් ඒ ද මැල් මාවත, කොළඹ 05. | 0332247055<br>0773679150 | 36576 |
| 33 | ජේ.සී.හාඩ්වෙයාර්,<br>කල්තොටපාර, මිරිස්වත්ත, බළන්ගොඩ. | 0452289176 | 37263 |
| 34 | සිසිර කන්ස්ට්‍රක්ෂන්ස්,<br>අංක 32/3, කරවිකැටිය, බළන්ගොඩ. | 0713002637 | 37471 |
| 35 | එල් ඊ සී සී මෙටල් ක්‍රෂර්,<br>අංක 306/3, හුණුකුඹුර, බළන්ගොඩ. | 0452287597<br>0773416997 | 37469 |
| 36 | අරලිය ඉංජිනියරින් පුද්ගලික සමාගම,<br>කර්මාන්ත පුරය, ලක්ෂ උයන,පොළොන්නරුව. | 0272222172 | 36443 |
| 37 | දිලුමිණි ගොඩනැගිලි ඉදිකරන්නෝ,<br>අංක 11, ආනන්ද මෛත්‍රී මාවත, බළන්ගොඩ. | 0452287447 | 37465 |
| 38 | බිටුමික්ස් පුද්ගලික සමාගම,<br>අදියර 02, ටෙම්පල් බර්ග් කර්මාන්ත පුරය, පනාගොඩ. | 0112752902<br>0112752905 | 37528 |
| 39 | සම්පත් කන්ස්ට්‍රක්ෂන්ස් ඇන්ඩ් මෙටීරියල් සප්ලයර්ස්,<br>අංක 117/3,පරණ පාර,බළන්ගොඩ. | 0771654225 | 37617 |
| 40 | ලීසරී කන්ස්ට්‍රක්ෂන්ස්,<br>අංක 12, වැලිපතයාය, බළන්ගොඩ. | 0725017732 | 37691 |
| **06. නාම පුවරු,දැන්වීම්,සමරුඵලක,බැනර්,කටවුට්,ඩිජිටල් පෝස්ටර් සකස්කර දීම.** | | | |

| | | | |
|---|---|---|---|
| 41 | තාරුක මාස් ඇඩ්වර්ටයිසිං,<br>අංක 147, බාන්ස් රත්වත්ත මාවත,<br>බළන්ගොඩ. | 0759314390<br>0452286815 | 37473 |
| **07. ක්‍රීඩා භාණ්ඩ ළදරු පාසල් උපකරණ සැපයීම** | | | |
| 42 | ලලන්ස් ස්පෝට්ස් ගුඩ්ස්,<br>කොළඹ පාර, හිදැල්ලන, රත්නපුර. | 0452228613<br>0777638415 | 36255 |
| 43 | ජෝති ස්ටෝර්ස්,<br>අංක 22, කෙළින් වීදිය, බළ්න්ගොඩ. | 0452287217 | 37470 |
| 44 | නෙකෝ ස්පෝට්ස්,<br>අංක 50 බී, නුවර පාර, දලුගම, කැළණිය. | 0112912898<br>0112914456 | 36639 |
| 45 | ජයවර්ධන ස්පෝට්ස්,<br>අංක 201/1, පුත්තලම් පාර, නිකවැරටිය. | 0375782122<br>0372260430 | 37506 |
| **08. තීන්තවර්ග (එනමල්,එමල්ෂන් සහ මළනිවාරණ) සැපයීම.** | | | |
| 46 | කෝස්වේ පේන්ට් ලංකා පුද්ගලික් සමාගම,<br>අංක 15, නොයෙල් මෙන්ඩිස් මාවත, මෝදරවිල,<br>පානදුර. | 0382240040<br>0382240046 | 36555 |
| 47 | ජේ.සී.හාඩ්වෙයාර්,<br>කල්තොටපාර, මිරිස්වත්ත, බළන්ගොඩ. | 0452289176 | 37263 |
| 48 | හර්ෂණ කලර් සෙන්ටර්,<br>අංක 208/බී, හපුතලේ පාර, බළන්ගොඩ. | 0452288121 | 37515 |
| **09. විදුලි උපකරණ හා උපාංග සැපයීම** | | | |
| 49 | ඇන්ටන් ඉලෙක්ට්‍රිකල්ස්,<br>අංක 67 ඒ, කුමාර වීදිය, කොළඹ 11. | 0112338264 | 36258 |
| 50 | ඒෂියන් ඉලෙක්ට්‍රිකල්ස්,<br>අංක 95 ඒ, පළම් හරස් වීදිය, කොළඹ 11. | 0112439142 | 36377 |
| 51 | සිටි ඉලේක්ට්‍රිකල්ස්,<br>අංක 23 1/3, දොරවෙල පාලම අසල, බළන්ගොඩ. | 0453468918<br>0777460844 | 37260 |
| 52 | මෙට්‍රොපොලිටන් ඔෆිස් පුද්ගලික සමාගම,<br>අංක 578 ඒ, නව නගරය, රත්නපුර. | 0454920310 | 36990 |
| 53 | සිල්වලයින් ඉලෙක්ට්‍රිකල්ස් ඇන්ඩ් ඉංජිනියරින් කම්පැණි,<br>අංක 239,මහ විද්‍යාලය මාවත, කොළඹ 13. | 0718264054<br>0112728864 | 37615 |

| | | | |
|---|---|---|---|
| 54 | කැළණි ඉලෙක්ට්‍රිකල්ස්,<br>අංක 59 එෆ්, තුඹගොඩ, බලන්ගොඩ. | 0774539660 | 37467 |
| 55 | සෙන්ට්‍රල් ඉලෙක්ට්‍රිකල්ස්,<br>අංක 80,82,මැලිබන් වීදිය, කොළඹ 11. | 0112435672<br>0112334552 | 36561 |
| 56 | ජේ.සී.හාඩ්වෙයාර්,<br>කල්තොටපාර, මිරිස්වත්ත, බලන්ගොඩ. | 0452289176 | 37263 |
| 57 | ඩීසල් ඇන්ඩ් මෝටර් ඉංජිනියරින් පීඑල්සී,<br>අංක 65, ජේතවන පාර, කොළඹ 14. | 0112449797<br>0112449080 | 37508 |
| 58 | නරාහ් කම්පියුටර් ෆෝම්ස්,<br>අංක 309/4සී, මීගමු පාර, වැලිසර. | 0112245700 | 37531 |
| 59 | එම්.ආර්.ඉලෙක්ට්‍රිකල්ස්,<br>අංක 149, විනිසුරු අක්බාර් මාවත,කොළඹ 02. | 0115769569<br>0112332900 | 37616 |
| **10. මුද්‍රණ කටයුතු, රබර් මුද්‍රා නිෂ්පාදන, මුද්‍රිත ෆෝරම සැපයීම** | | | |
| 60 | නිව් ශාස්ත්‍රෝදය මුද්‍රණාලය පුද්ගලික සමාගම,<br>අංක 10, මිහිඳු මාවත, කුලියාපිටිය. | 0372281189<br>0374944500 | 37507 |
| 61 | ඊ.එම්.ජී.කරුණාරත්න ඔෆ්සෙට් ප්‍රින්ටර්ස්,<br>අංක 18 ඒ, සිරි වීරසුන්දරාරාම මාවත, බලන්ගොඩ. | 0452288393<br>0777542649 | 37261 |
| **11. කාර්යාල උපකරණ අලුත්වැඩියා කිරීම.** | | | |
| 62 | ස්වදේශ් ට්‍රේඩින් ඕඩියෝ විෂුවල් පුද්ගලික සමාගම,<br>අංක 106, රතුකුරුස ගොඩනැගිල්ල,<br>ධර්මපාල මාවත, කොළඹ 07. | 0112699934 | 36577 |
| 63 | ගෙස්ටෙට්නර් ඔෆ් සිලෝන් පීඑල්සී,<br>අංක 248, වෝක්ෂෝල් වීදිය, කොළඹ 02 | 0112541351 | 36704 |
| 64 | මෙට්‍රොපොලිටන් ඔෆීස් පුද්ගලික සමාගම,<br>අංක 578 ඒ, නව නගරය, රත්නපුර. | 0454920310 | 36990 |
| 65 | නියුනෙට් කම්පියුටර් පුද්ගලික සමාගම,<br>අංක 850, කොළඹ පාර, හිදැල්ලන, රත්නපුර. | 0452228775<br>0452228784 | 37513 |
| **12. වාහන සේවා, අලුත්වැඩියා, වාහන අමතර කොටස් සැපයීම** | | | |
| 66 | පෙරේරා ටයර් සර්විස් පුද්ගලික සමාගම,<br>අංක 773/1, තලංගම උතුර, මාලඹේ. | 0112561410<br>0777311640 | 36254 |
| 67 | පී.එස්.ටයර් වර්ක්ස් ඇන්ඩ් සර්විසස්, | 0452287098 | 36566 |

| | | | |
|---|---|---|---|
| | අංක 149, හපුතලේ පාර, බලන්ගොඩ. | 0773023050 | |
| 68 | රිෂානා සර්විස්ටේෂන්,<br>අංක 68/2, රාස්සගල පාර, බලන්ගොඩ. | 0452287105 | 36914 |
| 69 | එම්.එස්.මෝටර් ට්‍රේඩර්ස්,<br>අංක 234 ඒ, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10. | 0112459053 | 36705 |
| 70 | ජයන්තා ට්‍රේඩර්ස්,<br>අංක 627, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, කොළඹ | 0112396441 | 36376 |
| 71 | ටෝකියෝ ටයර් පුද්ගලික සමාගම,<br>අංක 52 ඒ, කර්මාන්ත පුරය, දංකොටුව. | 0312259648 | 36563 |
| 72 | ද ටයර් ටීම්,<br>අංක 56 ඒ, එස් ද එස් ජයසිංහ මාවත, කොහුවල. | 0112829000 | 36565 |
| 73 | ධර්මසිරි ටයර් හවුස් පුද්ගලික සමාගම,<br>අංක 35/6, ෂොප් පෙදෙස, කදුරුවෙල. | 0717985985<br>0272223276 | 36562 |
| 74 | සී/ස ඔගස්ටින් මෝටර්ස් පුද්ගලික සමාගම,<br>පැරඩයිස් කර්මාන්ත පුරය, අදියර 01, කුරුවිට. | 0452262471 | 36560 |
| 75 | යූ ඇන්ඩ් එච් වීල් සර්විස් පුද් සමාගම,<br>අංක 72, මැලේ වීදිය, කොළඹ 02. | 0112432112<br>0112454855 | 36703 |
| 76 | කේ.ජී.ඔටෝ ක්ලීන් ඇන්ඩ් ඉංජිනියරින්,<br>කිරිමැටිතැන්න, බලන්ගොඩ. | 0452287384 | 36706 |
| 77 | බෙනඩික්ට් සන්ස් පුද්ගලික සමාගම,<br>අංක 221 1/2, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10. | 0115445400<br>0115445415 | 36886 |
| 78 | ඩීසල් ඇන්ඩ් මෝටර් ඉංජිනියරින් පී එල් සී,<br>අංක 65, ජාවත්ත පාර, කොළඹ 14. | 0112449797 | 37508 |
| 79 | ජයන්ති ටයර් සෙන්ටර්,<br>රත්නපුර පාර, බලන්ගොඩ. | 0452286928 | 37514 |
| 80 | ඩිමෝ ඩීසල් ඇන්ඩ් මෝටර් ඉංජිනියරින් පීඑල්සී,<br>තැ.පෙ.339, ජාවත්ත පාර, කොළඹ 14. | 0112449797<br>0112449080 | 37527 |
| **13. කුලී පදනම මත ප්‍රවාහන කටයුතු සඳහා වාහන සැපයීම** | | | |
| 81 | ජේ.සී.හාඩ්වෙයාර්,<br>කල්තොටපාර, මිරිස්වත්ත, බලන්ගොඩ. | 0452289176 | 37263 |
| **14. සෞඛ්‍ය උපකරණ හා විෂබීජ නාශක ද්‍රව්‍ය සැපයීම** | | | |

| | | | |
|---|---|---|---|
| 82 | ලලන්ස් කන්ස්ට්‍රක්ෂන්ස්,<br>කොළඹ පාර, මලන්ගම, හිදැල්ලන, රත්නපුර | 0452228613 | 36256 |
| 83 | ජෝති ස්ටෝර්ස්,<br>අංක 22, කෙළින් වීදිය, බළන්ගොඩ. | 0452287217 | 37470 |
| 84 | සිල්වලයින් ඉලෙක්ට්‍රිකල්ස් ඇන්ඩ් ඉංජිනියරින් කම්පැණි,<br>අංක 239,මහ විද්‍යාලය මාවත, කොළඹ 13. | 0718264054<br>0112728864 | 37615 |
| 85 | ඇන්ට්ලර් ඉන්ඩස්ට්‍රීස් පුද්ගලික සමාගම,<br>අංක 170, මඩපාත පාර, පිලියන්දල. | 0112619217<br>0112609218 | 36448 |
| **15. පිඟන් භාණ්ඩ සැපයීම** | | | |
| 86 | ජෝති ස්ටෝර්ස්,<br>අංක 22, කෙළින් වීදිය, බළන්ගොඩ. | 0452287217 | 37470 |
| **16. පුස්තකාල පොත් සැපයීම** | | | |
| 87 | සමයවර්ධන පොත්හල පුද්ගලික සමාගම,<br>අංක 61,63, හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි මාවත,<br>(මාලිගාකන්ද මාවත), මරදාන,කොළඹ 10. | 0112683986<br>0112677539 | 36564 |
| 88 | ජෝති ස්ටෝර්ස්,<br>අංක 22, කෙළින් වීදිය, බළන්ගොඩ. | 0452287217 | 37470 |
| 89 | එස්.ගොඩගේ සහ සහෝදරයෝ පුද්ගලික සමාගම,<br>අංක 675, පී ද එස් කුලරත්න මාවත, කොළඹ 10. | 0112685369<br>011286925 | 36889 |
| **17. නිල ඇඳුම් සඳහා රෙදි සැපයීම** | | | |
| 90 | ටොයෝටා ටෙක්ස්,<br>අංක 40 1/1, බැන්ෂෝල් ස්ට්‍රීට්, කොළඹ 11. | 0112436439 | 36379 |
| 91 | ලිතුමිතාස්,<br>අංක 19/ඒ, කේෂර් ස්ට්‍රීට්, කොළඹ 11 | 0112432106<br>0113136908 | 36380 |
| 92 | ප්‍රශංසා ගාමන්ට් ආන්ඩ් ටේලර්ස්,<br>අංක 49, ලෝටස් පාර, කොළඹ 01. | 0112320486<br>0112331617 | 36988 |
| 93 | වීප් සයිඩ්,<br>අංක 24, කෙළින් වීදිය, බළන්ගොඩ. | 0452287346 | 37463 |
| **18. ශ්‍රව්‍ය දෘෂ්‍ය හා පටිගත කිරීමේ උපකරණ සැපයීම.** | | | |
| 94 | ජෝන් කීල්ස් ඔෆීස් ඔටෝමේෂන් පුද්ගලික සමාගම,<br>අංක 90, යුනියන් ප්ලේස්, කොළඹ 02. | 0112313000 | 36375 |

| | | | |
|---|---|---|---|
| 95 | ඩයිනමික් ඒවී ටෙක්නොලොජීස් පුද්ගලික සමාගම,<br><br>අංක 06, දෙවන පටුමග, නාවල, රාජගිරිය. | 0112877071 | 36559 |
| 96 | ගෙස්ටේට්නර් ඔෆ් සිලෝන් පීඑල්සී,<br><br>අංක 248, වෝක්ෂෝල් වීදිය, කොළඹ 02. | 0114725500 | 36704 |
| **19. පරිභෝජන භාණ්ඩ, වියලි සහ අනෙකුත් ආහාර ද්‍රව්‍ය සැපයීම** | | | |
| 97 | කිසිවකු ලියාපදිංචි වී නැත. | | |
| 20. වෙනත් | | | |
| 98 | කිසිවකු ලියාපදිංචි වී නැත. | | |
| **කොන්ත්‍රාත්කරුවන්** | | | |
| **රු.100,000.00 සිට රු.1,000,000.00 දක්වා කාණ්ඩයන්ට කිසිවකු ලියාපදිංචි වී නැත.** | | | |
| **රු.1,000,000.00 ට වඩා වැඩි** | | | |
| 99 | කේ.වී.සී.ප්‍රඩක්ෂන්ස් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන්ස්,<br><br>අංක 39/5,කරදියමුල්ල,බළන්ගොඩ. | 0452288008 | 37104 |
| 100 | ජේ.සී.කන්ස්ට්‍රක්ෂන්ස්,<br>අංක 174, උඩ අරාව,මස්සැන්න,බළන්ගොඩ.<br><br>ලි.ප.අංකය: ර/බ/01471 | 0773858412 | 37262 |
| 101 | සිසිර කන්ස්ට්‍රක්ෂන්ස්,<br><br>අංක 32/3, කරව්කැටිය,බළන්ගොඩ. | 0713002637 | 37471 |
| 102 | විජේසුන්දර කන්ස්ට්‍රක්ෂන්ස්,<br><br>අංක 36/ඒ, කොටුගොඩැල්ල, බළන්ගොඩ | 0726089540 | 37474 |

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:17 නිවාඩු අනුමත කර ගැනීම . නගර සභා ගරු මන්ත්‍රී ඒ.අසංක නිල්මිණි විජේසිංහ මැතිතුමා**

අසනීප තත්වය හේතු කොට ගෙන සභාව වෙත පැමිණිය නොහැකි බව දන්වමින් නගර සභා ගරු මන්ත්‍රී ඒ.අසංක නිල්මිණි විජේසිංහ මැතිතුමා විසින් එවන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාව වෙත ඉදිරිපත් කරමින් නිවාඩු අනුමත කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගරසභා ගරු මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**06:18 2015 මාර්ග නඩත්තු සැලැස්ම අනුමැතියට ඉදිරිපත් කිරීම.**

බලංගොඩ නගර සභාව මගින් සිදු කිරීමට අපේක්ෂිත 2015 වර්ෂයේ මාර්ග නඩත්තු සැලැස්ම සඳහා අනුමැතිය අවශ්‍ය බව පවසමින් ඉදිරිපත් කර තිබූ ලිපිය ගරු සභාව වෙත ඉදිරිපත් කල ගරු සභාපතිතුමා විසින් ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:19 2015 වැසිජල කාණු නඩත්තු සැලැස්ම අනුමැතියට ඉදිරිපත් කිරීම.**

බලංගොඩ නගර සභාව මගින් සිදු කිරීමට අපේක්ෂිත 2015 වර්ෂයේ වැසිජල කාණු නඩත්තු සැලැස්ම සඳහා අනුමැතිය අවශ්‍ය බව පවසමින් ඉදිරිපත් කර තිබූ ලිපිය ගරු සභාව වෙත ඉදිරිපත් කල ගරු සභාපතිතුමා විසින් ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:20 2015 බලංගොඩ නගරයේ හෝරා ස්ථම්භය සහිත වටරවුම් නඩත්තු සැලැස්ම අනුමැතියට ඉදිරිපත් කිරීම.**

2015 වර්ෂයේ බලංගොඩ නගරයේ හෝරා ස්ථම්භය සහිත වටරවුම් නඩත්තු සැලැස්ම සඳහා අනුමැතිය අවශ්‍ය බව පවසමින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාව වෙත ඉදිරිපත් කල ගරු සභාපතිතුමා විසින් ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:21 ඩබ්.බී.ජයතිලක යන අයගේ 2014 වර්ෂය සඳහා අයකර ගත් වරිපනම් ගාස්තු ආදායමෙන් ආපසු ගෙවීම.**

ඩබ්.බී.ජයතිලක යන අයගේ 2014 වර්ෂය සඳහා වැරදීමකින් අයකර ගත් වරිපනම් ගාස්තු, ආදායමෙන් ආපසු ගෙවීම සඳහා අනුමැතිය අවශ්‍ය බව පවසමින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාව වෙත ඉදිරිපත් කල ගරු සභාපතිතුමා විසින් එම මුදල් ආදායමෙන් නැවත ගෙවීම සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:22 වැය මාරු කිරීම**

2014 වර්ෂ අවසානයේ වැය මාරු කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය පතමින් ඉදිරිපත් කර තිබූ වාර්තාව මහ සභාව වෙත ඉදිරිපත් කල ගරු සභාපතිතුමා විසින් ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:23 ආපදා සඳහා ආධාර ඉල්ලීම**

**06:23:01 එන්.කේ.බණ්ඩාර මැණිකේ මහත්මිය**

දේගපිටිය,කිරිදිගල, බලංගොඩ පදිංචි එන්.කේ.බණ්ඩාර මැණිකේ මහත්මියගේ නිවස පිටුපස බිත්තියට පස් කන්දක් කඩාවැටීම නිසා පිටුපස බිත්තිය අඩි10 ක් පමණ හානි සිදු වී ඇති හෙයින් එය පිළිසකර කර ගැනීම සඳහා ආධාරයක් ඉල්ලා ගරු සභාව වෙත එවා තිබූ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාව වෙත ඉදිරිපත් කරමින් ඒ සඳහා මුදලින් රු.10,000 ක ආධාරයක් ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:23:02 ඩී.බී.සරත් ප්‍රියංකර මහතා**

දොරවෙළ, බලංගොඩ පදිංචි ඩී.බී.සරත් ප්‍රියංකර, බී එන්දෝරිස්, බී අනුර ජයරත්න යන මහත්වරුන්ගේ නිවාස අධික වර්ෂාව හේතුවෙන් නාය යාමේ අවදානමකට ලක්වී ඇති නිසා පැති බැම්මක් ඉදිකර ගැනීම සඳහා ආධාරයක් ඉල්ලා ගරු සභාව වෙත එවා තිබූ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාව වෙත ඉදිරිපත් කරමින් ඒ සදහා එක් අයෙකුට මුදලින් රු.10,000 බැගින් රු.30,000 ආධාර මුදලක් ලබා දීමට යෝජනා කරන ලදී.
එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී චමික ජයම්ණ වැවේගෙදර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:23:03 ඇම් ජන්දිරිස් මහතා**

දොරවෙළ, බලංගොඩ බලංගොඩ පදිංචි ඇම් ජන්දිරිස් මහතාගේ නිවස පිටුපස ඉවුර කඩාවැටීමේ අවදානමක් ඇති නිසා පැති බැම්මක් ඉදිකර ගැනීම සඳහා ආධාරයක් ඉල්ලා ගරු සභාව වෙත එවා තිබූ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාව වෙත ඉදිරිපත් කරමින් ඒ සදහා මුදලින් රු.10,000 ක ආධාරයක් ලබා දීමට යෝජනා කරන ලදී.
එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී චමික ජයම්ණ වැවේගෙදර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:23:04 කේ.බී. ප්‍රියංකා මල්කාන්ති මහත්මිය**

තුඹගොඩ,බැංකියවත්ත,බලංගොඩ පදිංචි කේ.බී. ප්‍රියංකා මල්කාන්ති මහත්මියගේ නිවස ඉවුර කඩාවැටීම පාර අවහිර වීමෙන් වාහනවලට යාමට අපහසු තත්වයක් උද්ගත වී ඇති නිසා පස් ඉවත් කර දීමට කටයුතු කර දෙන මෙන් ඉල්ලා ගරු සභාව වෙත එවා තිබූ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාව වෙත ඉදිරිපත් කරමින් ඒ සදහා මුදලින් රු.10,000 ක ආධාරයක් ලබා දීමට යෝජනා කරන ලදී.
එම යෝජනාව ගරු උප සභාපති වසන්ත ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:23:05 කේ.බී. ප්‍රියංකා මල්කාන්ති මහත්මිය**

ඇල්ලෙඅරාව ,බලංගොඩ පදිංචි ඩබ්.කේ.ඩී.රේණුකා මහත්මියගේ නිවස අසළ දිය උල්ලාරම් මතුවී ආපාදා සහගත තත්වයක් උද්ගත වී ඇති බැවින් එය පිළිසකර කර ගැනීම සඳහා ආධාරයක් කරන මෙන් ඉල්ලා ගරු සභාව වෙත එවා තිබූ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාව වෙත ඉදිරිපත් කරමින් ඒ සදහා මුදලින් රු.10,000 ක ආධාරයක් ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:23:06 ඒ.එල්.අක්බරලි මහතා**

මුස්තාෆා මාවත ,බලංගොඩ පදිංචි ඒ.එල්.අක්බරලි මහතාගේ නිවස අසළ නාය යාම හේතුවෙන් මුළුතැන්ගෙයට අලාභ හානිසිදු වී ඇති නිසා එය පිළිසකර කර ගැනීම සඳහා ආධාරයක් කරන මෙන් ඉල්ලා ගරු සභාව වෙත එවා තිබූ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාව වෙත ඉදිරිපත් කරමින් ඒ සදහා මුදලින් රු.10,000 ක ආධාරයක් ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුම් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:23:07 යූ.කේ.ආරියතුංග මහතා**

හුණුකුඹුර ,බලංගොඩ පදිංචි යූ.කේ.ආරියතුංග මහතාගේ නිවස අසළ නාය යාම හේතුවෙන් පැතිබැම්මට අලාභ හානිසිදු වී ඇති නිසා එය පිළිසකර කර ගැනීම සඳහා ආධාරයක් කරන මෙන් ඉල්ලා ගරු සභාව වෙත එවා තිබූ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාව වෙත ඉදිරිපත් කරමින් ඒ සඳහා මුදලින් රු.10,000 ක ආධාරයක් ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුම් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:23:08 බී.එල්.ඒ. ලීලා බලපිටිය මහත්මිය**

අංක 41/2 ,දොරටවළ, බලංගොඩ පදිංචි බී.එල්.ඒ. ලීලා බලපිටිය මහත්මියගේ නිවස අසළ නාය යාම හේතුවෙන් පත් වී ඇති අවදානම් සහගත තත්වය පිළිබඳව සළකා බලා නිසා ආධාරයක් කරන මෙන් ඉල්ලා ගරු සභාව වෙත එවා තිබූ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාව වෙත ඉදිරිපත් කරමින් ඒ සඳහා මුදලින් රු.10,000 ක ආධාරයක් ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී චමික ජයම්ණ වැවේගෙදර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

## 07. රු. 10,000.00 ට වැඩි මුදල් ගෙවීම් අනුමත කිරීම

රු. 10,000.00 ට වැඩි ගෙවීම් සියල්ල මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා ගරු සභාපතිතුමන් විසින් මහා සභාවේ අනුමැතිය ලබාදීමට යෝජනා කරන ලදි.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 08. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

## 09. ලංසු මිල ගණන් සලකා බැලීම

09:01 **වටරවුම් සඳහා මල්පැළ රෝපණය කිරීම බෝගන්විලා මල් මිලදී ගැනීම.**

බලංගොඩ නගරයේ වටරවුම් සඳහා බෝගන්විලා මල් පැල රෝපණය කිරීමට අවම මිල ගණන් කැඳවා ඇති බවත්, එහි දී අවම මිල ගණන් ලෙස ඉ/මාවිල, නාත්තන්ඩිය පාරේ සඳලිය පැල තවාන මඟින් පැළයක් රුපියල් තුන්සිය පනහක මුදලකට යටත්ව මෙම කාර්යය කිරීමට එකඟ වී ඇති බවත් පැවසූ ගරු සභාපතිතුමා ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුම් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**09:02 RC- 1118 ට්‍රැක්ටරයට ටයර් හා ටියුබ් ලබා ගැනීම.**

බලංගොඩ නගර සභාව සතු RC- 1118 ට්‍රැක්ටරයට ටයර් හා ටියුබ් ලබා ගැනීම අවම මිල ගණන් කැඳවා ඇති බවත්, එහි දී අවම මිල ගණන් ලෙස u & h wheel service ආයතනය මගින් 600x15 ටයර් හා ටියුබ් ලබාගැනීම සඳහා ටයර් 01ක් රුපියල් එකොලොස් දහස් නවසිය පනස් හතයි ශත දොළහක් හා ටියුබ් 01 ක් රුපියල් එක් දහස් තුන්සියය හතළිස් හතරක මුදලකට යටත්ව මෙම කාර්යය කිරීමට එකඟ වී ඇති බවත් පැවසූ ගරු සභාපතිතුමා ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුම් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය

**09:03 RC- 1118 ට්‍රැක්ටරයට ටයර් හා ටියුබ් ලබා ගැනීම.**

බලංගොඩ නගර සභාව සතු RC- 1118 ට්‍රැක්ටරයට ටයර් හා ටියුබ් ලබා ගැනීම අවම මිල ගණන් කැඳවා ඇති බවත්, එහි දී අවම මිල ගණන් ලෙi u & h wheel service ආයතනය මගින් 13.6 x 2.8 ටයර් හා ටියුබ් ලබාගැනීම සඳහා ටයර් 01ක් රුපියල් හැත්ත හත් දහස් හැට එකයි ශත හැටක් හා ටියුබ් 01 ක් රුපියල් හාරදහස් අටසිය හතලිස් එකයි ශත හැත්තෑ හයක මුදලකට යටත්ව මෙම කාර්යය කිරීමට එකඟ වී ඇති බවත් පැවසූ ගරු සභාපතිතුමා ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුම් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**09:03 JCB යන්ත්‍රයට ටයර් හා ටියුබ් ලබා ගැනීම.**

බලංගොඩ නගර සභාව සතු jcb යන්ත්‍රයට ටයර් හා ටියුබ් ලබා ගැනීම අවම මිල ගණන් කැඳවා ඇති බවත්, එහි දී අවම මිල ගණන් ලෙස u & h wheel service ආයතනය මගින් ටයර් හා ටියුබ් ලබාගැනීම සඳහා ටයර් 01ක් රුපියල් හතලිස් නව දහස් හයසිය හතලිස් හයයි ශත විසි හතරක් හා ටියුබ් 01 ක් රුපියල් තුන්දහස් නවසිය විස්සක මුදලකට යටත්ව මෙම කාර්යය කිරීමට එකඟ වී ඇති බවත් පැවසූ ගරු සභාපතිතුමා ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුම් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

09:03 rc 8183 හා rb 4786 දරන ට්‍රැක්ටර් හා ගලි බවුසරයට අමතර කොටස් මිලදී ගැනීම.

බලංගොඩ නගර සභාව සතු rc 8183 හා rb 4786 දරන ට්‍රැක්ටර් හා ගලි බවුසරයට අමතර කොටස් මිලදී ගැනීම සඳහා අවම මිල ගණන් කැඳවා ඇති බවත්, එහි දී අවම මිල ගණන් ලෙස ආයතනය මගින් ටයර් හා ටියුබ් ලබාගැනීම සඳහා ටයර් 01ක් රුපියල් හතලිස් නව දහස් හයසිය හතලිස් හයයි ශත විසි හතරක් හා ටියුබ් 01 ක් රුපියල් තුන්දහස් නවසිය විස්සක මුදලකට යටත්ව මෙම කාර්යය කිරීමට එකඟ වී ඇති බවත් පැවසූ ගරු සභාපතිතුමා ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රි එම්.ටී.එම්.රූම් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

## 10. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්නඃ

**මෙදින සභාව සඳහා යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න ඉදිරිපත් නොවිනි.**

## 11. යෝජනා

**11:01 නගර සභා ගරු මන්ත්‍රි චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා.**

11:01:01 දොරවෙල නාය යාමෙන් අසරණ වූ නිවෙස් හිමියන්ගේ නිවාසවල ආරක්ෂාව සඳහා අවශ්‍ය පරිදි ආරක්ෂිතව පැතිබැම් යෙදීම සඳහා යෝජනා කිරීම.

දොරවෙල නාය යාමෙන් අසරණ වූ නිවෙස් හිමියන්ගේ නිවාසවල ආරක්ෂාව සඳහා අවශ්‍ය පරිදි ආරක්ෂිතව පැතිබැම් යෙදීම සඳහා ආධාර මුදලක් ලබා දීම සුදුසු බවට නගර සභා ගරු මන්ත්‍රි චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා විසින් ගෙනා යෝජනාව ස්ථිර කල ගරු සභාපතිතුමා විසින් ඒ සඳහා රු.30,000 මුදලක් ආධාර වශයෙන් ලබා දීමට කටයුතු කරන ලෙස අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදි.

## 12. කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම

**මෙදින සභාව සඳහා කාරක සභා වාර්තා ඉදිරිපත් නොවිනි.**

## 13. ආදායම් වියදම් වාර්තා ඉදිරිපත් කිරීම

**13:01 2014 ඔක්තෝම්බර් මාසය සඳහා වන ලැබීම් හා ගෙවීම් විග්‍රහය ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 8,259,135.05 |
| වෙනත් ලැබීම් | 2,086,738.01 |
| මුළු ලැබීම් | 10,345,873.06 |
| පුනරාවර්තන වියදම් | 9,349,777.64 |
| වෙනත් වියදම් | 2,982,776.69 |
| මුළු වියදම් | 12,332,554.33 |

ඉහත වාර්තාව සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් ඉදිරිපත් නොවූයෙන් මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**13:02 2014.11.01 සිට 2014.11.30 දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාව**

2014.11.01 සිට 2014.11.30 වන දින දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී. අදාල කාලසීමාවට අදාලව වාහන සඳහා මුළු ඉන්ධන වියදම රු. 534,971.20 කි.

ඉහත ඉන්ධන වියදම් වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

නගර සභා ගරු මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලද අතර, එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

## 14. වෙනත් කරුණු

**14:01 ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික්ෂා මැතිතුමා**

2014 අවසාන මහ සභා රුැස්වීම සඳහා යෝජනා ඉදිරිපත් නොකලේ කලින් කරන ලද යෝජනා සම්මත වූ නමුත් ඒ සඳහා මෙතෙක් සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත් බැවින් බව පෙන්වා දුන් ගරු මන්ත්‍රීතුමා ෆලීල් හාජියාර් මාවත,වතුර ටැංකිය පාර කඩිනමින් පිළිසකර කර දෙන මෙන් නැවතත් ගරු සභාවෙන් ඉල්ලා සිටින ලදී.

2015 මැතිවරණය දෙස මුළු ලොවම උනන්දුවෙන් අවධානය යොමු කරගෙන සිටින බවත්, මෙවර එක්සත් ජාතික පක්ෂය සමග ශ්‍රී ලංකා නිදහස් පක්ෂය,මුස්ලිම් කොන්ග්‍රසය වැනි පක්ෂ රාශියක් එකතුව සිටින බව පැවසූ ගරු මන්ත්‍රීතුමා ලොකු තරඟයක් තුළින් 2015.01.09 දින රට තුළ ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විශ්වාසනීය වෙනසක් තුළින් විශිෂ්ඨ ජයක් ලබන බව තමා සියයට දෙසීයක් විශ්වාස කරන බවද පැවසීය.
දින සියයේ ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ රජයේ නිළධාරින් සඳහා පෙබරවාරි මාසයේ සිට රුපියල් 5000 වැටුප් වැඩි වීමක් සහ ආහාර සඳහා පනවන ලද බදු 10% න් අඩු කිරීම තුළින් ලබන සිංහල ,හින්දු අළුත් අවුරුද්ද සතුටින් සැමරීම සඳහා අවකාශ ලැබෙන බව ප්‍රකාශ කල ගරු මන්ත්‍රීතුමා, නැවත 2015 වර්ෂයේ දි පැවැත්වෙන පළමු මහ සභා රැස්වීම අළුත් ආණ්ඩුවක් යටතේ මෛත්‍රී පාලනයක් සමඟ පැවැත්විමට හැකියාව ලැබෙන බවද පැවසීය.

බලංගොඩ නගර සභාව මගින් පිළියෙල කරන ලද අයවැය ලේඛනයේ පිටු අංක 192 සිට දෙමළ පරිවර්තනය වැරදි බව පෙන්වා දුන් ගරු මන්ත්‍රීතුමා , එය නිවැරදි කල යුතු බව මහ සභාව වෙත දන්වන ලදී.පක්ෂ භේද දුරලා , සියළු දෙනා අත්වැල් බැඳ ගනමින් රට වෙනුවෙන් මෛත්‍රී පාලනයක් සඳහා එක් වෙමුයි අවසාන වශයෙන් පවසන ලදී.

**14:02 ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා**

පසුගිය අයවැය සභාවේ ගරු නාගරික මන්ත්‍රී අසංක විජය නිල්මිණි මහතා සිත් තැවුලට පත් වෙමින් සභාවේ වූ කණගාටු දායක තත්වය පිළිබඳව අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමා අප කවුරුත් නෙළන දෙය අනුව එහි අස්වැන්න නෙළාගත හැකි බවත්,වෛරය වැපරීම තුළින් නෙළාගත හැකි වන්නේ වෛරයම පමණක් බවත් සහෝදර නාගරික මන්ත්‍රී රුමි මැතිතුමා වෙත පැවසීමට කැමති බව ප්‍රකාශ කරන ලදී. ඒ පිළිබඳ තව දුරටත් අදහස් දක්වමින් සභාවේ කීර්තිය හා ගෞරවය කෙලෙසමින් ප්‍රශ්න ඇතිකර ගන්නවාද නැතහොත් ඒ සියල්ල රැක ගනිමින් බුද්ධිමත්ව සිතා බලා කටයුතු කරනවාද යන්න අප විසින්ම තීරණය කල යුතු බවත් ,මැතිවරණ ඉලක්ක කර ගෙන

නොව,ඉදිරි පරම්පරාව ගැන සිතා බලා කටයුතු කිරීම තමන්ගේ ප්‍රතිපත්තිය බව මෙහිදී ගරු මන්ත්‍රීතුමා විසින් පවසන ලදී.

නගර සභාව වෙත බදවා ගත් කම්කරුවන් පිළිබඳව අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමා මාර්ග නඩත්තු කම්කරුවන් ප්‍රමානය අවම මට්ටමක පැවතීම නිසා, නගරයේ සිදුවන අපාදා තත්වයන්ට මුහුණ දීමේදි දුෂ්කරතා මතුවන බව පවසන ලදී.එමෙන්ම නගර සභාව වෙත අළුතින් බදවා ගත් කාර්යාල සහයක නිලධාරින් සමහරක් නිහතමානි නොවන අයුරින් කටයුතු කිරීම ප්‍රසන්න නොවන බව පැවසූ ගරු මන්ත්‍රීතුමා ඒ සියල්ල නිවැරදි කර ගෙන ඉදිරියට යෑම වැදගත් බවද පවසන ලදී.

අයවැය වාර්තාව සදහා පක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීම නිසා පසුගිය දිනෙවල තමන් හා ගරු නාගරික මන්ත්‍රී මලීක්ෂා මැතිතුමන් පක්ෂ මාරු කිරීමට යන බවට අසත්‍ය ප්‍රකාශ ප්‍රචාරය වී ඇති බවත් එසේ කිසිදු අදහසක් නැති බවත් පැවසූ ගරු මන්ත්‍රීවරයා එසේම බලංගොඩ නතර සභාව සතු ගෞරවය රැක ගැනීමට හා විනිවිද බාවයෙන් කටයුතු කිරීමට හැකියාව ලැබෙන බැවින් බලංගොඩ තානායම ටෙන්ඩර් කිරීම සුදුසු බවට මෙහිදි අදහස් දක්වන ලදී.

2014 වර්ෂයේ සංවර්ධන කාර්යයන් සදහා සහය දුන් පක්ෂ,විපක්ෂ දේශපාලන නියෝජිතයන් හා රජයේ නිළධාරින් ඇතුළු සියළු දෙනාට ස්තුති කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා බව පැවසූ ගරු නාගරික මන්ත්‍රීතුමා 2015.01.08 දිනෙන් පසුව යහපාලනයකින් යුත් මෛත්‍රී පාලනයක් තුල ජීවත්වීමට ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මාධ්‍යවේදීන් වෙත ගෙවන දීමනාව පිළිබඳ සභාවේ සාකච්ඡා කොට සාධාරණයක් වන පරිදි තීරණයක් ගැනීම සුදුසු බව පවසමින් කරුණු දැක්වීම අවසන් කරන ලදී.

**14:03 ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුමි මැතිතුමා**

අයවැය සම්මත කර ගැනීම සදහා සහය ලබාදුන් ගරු විපක්ෂ මන්ත්‍රීවරුන් දෙපළට ස්තුතිවන්ත වන බව පැවසූ ගරු මන්ත්‍රීතුමා සුළු ජාතින්ගේ සහය ලබාගෙන ඉතිහාසයේ පෙර දිනෙක නොවූ අයුරින් ජාතිවාදය අවුස්සමින් මෛත්‍රී පාලනයක් වෙනුවෙන් ජයග්‍රහණය කිරීමට තැත් කිරීම වැරදි සහගත බව පැවසූ අතර නැගෙනහිර හා උතුරු ප්‍රදේශ කරා ස්වයං පාලනයක් ලබාදීමට ගිවිසුම් ගසමින් කරගෙන යන මැතිවරණ ප්‍රචාරය හෙළා දකින බවද පවසන ලදී.

දශක 30ක් තිස්සේ පැවති යුද්ධය නිමා කරමින් සැමට දේශපාලන ව්‍යාපාර කර ගෙන යාමට හැකියාව ලැබුනේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා නිසා බව පැවසූ ගරු මන්ත්‍රීතුමා පොදු විපක්ෂය විසින් රට තුල අභ්‍යන්තර අර්බුද ඇති කරමින් රට කැලි කිරීමට දරන උත්සාහය පැරදවිය යුතු බවට අදහස් දක්වන ලදී.කෙසේ නමුත් ගමේ ආර්ථිකය ශක්තිමත් කල අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා සමග ගම්වැසියන් තවමත් එදා මෙන් එක්ව සිටින බව පැවසූ ගරු මන්ත්‍රීතුමා ලක්ෂ 20ට වැඩි ඡන්ද ප්‍රමාණයකින් එතුමාගේ ජයග්‍රහණය ස්ථිර බවද ,බලංගොඩ ආසනය වැඩි ඡන්ද 30,000න් ජයග්‍රහණය කරනු ඇතැයිද පැවසීය.

2014 වර්ෂයේදි නගරය තුළ විශාල සංවර්ධන කාර්යයක් ඉටු කිරීමට උර දුන් සභාපතිතුමා,නාගරික මන්ත්‍රිවරුන්,ලේකම්තුමිය, ඇතුළු කාර්යය මණ්ඩලයට ස්තුතිය පිරිනැමූ ගරු මන්ත්‍රීතුමා 2015 වර්ෂය මහින්ද පාලනයක් සහිත සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරමින් අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**14:04 ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා**

2015 ජනාධිපති මැතිවරණය ඉදිරියේ සිටින අප පළාත් පාලන ආයතන නියෝජනය කරන මන්ත්‍රීවරුන් ලෙස මේ වන විට ගම්වල සංවර්ධන කටයුතු සෑම දෙයක්ම නිම කර ඇති බව පැවසූ ගරු මන්ත්‍රීතුමා කවුරුන් කෙසේ කීවත් දුර දකින පාලනය අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ

මැතිතුමාගේ පාලනය බව පවසන ලදී. එතනෝල්, කුඩු ව්‍යාපාර පිළිබඳ පෝස්ටර් ප්‍රචාරය කරමින් මඩ හා බොරු ප්‍රචාර එල්ල කල ද ඇත්ත ඇති සැටියෙන් දැකීම බුද්ධිමත් ජනතාව සතු කාර්යයක් බව පැවසූ එතුමා එදා සිටි ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ ඡායාරූප ළග තබා ගනිමින් කසිප්පු විකිණූ යුගය පිළිබඳ කාටත් නොරහසක් බවට අදහස් ප්‍රකාශ කරන ලදී.

2015 වර්ෂය අතිගරු ජනාධිපතිතුමා, සභාපතිතුමා, ගරු නාගරික මන්ත්‍රීවරුන්, නගර සභාවේ සියලු දෙනා ඇතුළු ලක්වාසී සැමට සුභ නව වසරක් හා සුභ අනාගතයක් වේවා යි පතමින් කරුණු දැක්වීම අවසන් කරන ලදී.

**14:05 ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා**

2014 වර්ෂය තුල සිදු කිරීමට හැකි වූ විශාල සංවර්ධන කාර්යභාරය උදෙසා ප්‍රතිපාදන හා උපදෙස් ලබා දෙමින් සහය දැක් වූ අතිගරු ජනාධිපතිතුමා, දේශපාලන අධිකාරිය ඇතුළු සහය දුන් සැමට ගෞරවනීය ප්‍රශංසාව පිරිනැමීමට මෙය අවස්ථාවක් කරගන්නා බවට පැවසූ ගරු මන්ත්‍රීතුමා විපක්ෂයේ මන්ත්‍රීවරුන් මෛත්‍රී පාලනයක් තුලින් සැබෑ වෙනසක් අවශ්‍ය බවට කෙසේ කරුණු කීවත් රටේ ජනතාවට එවන් වෙනසක් අවශ්‍ය වී නැති බව පවසන ලදී. දශක 30 ක් පැවති කුරිරු යුද්ධය නිමා කරමින් සංවර්ධන කටයුතු දියුණු කර, නිදහසේ ජීවත් වීමට නිදහසේ මාධ්‍ය හැසිරවීමට ඉඩ සලසා දුන් රජය පිළිබඳවත්, රට ආරක්ෂා කර, රට සුරකින නායකයා පිළිබඳ ජනතා ප්‍රසාදය අඩු වී නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.

පටු අවශ්‍යතා පිරිමසා ගැනීමට හා වරප්‍රසාද හා වරදාන බලාපොරොත්තුවෙන් සමහරක් දේශපාලන නියෝජිතයන් පිල් මාරු කිරීම රටට හිතැතිව ගත් තීන්දු තීරණ නොවන බවත්, 2015 ජනවාරි මස විශාල ජයග්‍රහණයක් තුලින් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා බලයට පත් කිරීම සඳහා 2015 ජනවාරි 08 වන දින කෙළෙහි ගුණ සැලකීමේ මහා පින්කම ඉෂ්ට සිද්ධ කර ගන්නා මෙන් පැවසූ ගරු නාගරික මන්ත්‍රීතුමා අතිගරු ජනාධිපතිතුමා ඇතුළු සැමටම ජය වේවා යි පතමින් කරුණු දැක්වීම අවසන් කරන ලදී.

**14:06 ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා**

වර්ෂය අවසාන මහා සභා රැස්වීම පවත්වන අද දින සභාව දේශපාලන වේදිකාවක් කර ගැනීමට අවශ්‍ය නැති බවත්, එසේ අදහස් ප්‍රකාශ කළ යුත්තේ ජනතාව ඉදිරියට ගොස් ජනතාව වෙත බවත්, පැවසූ ගරු මන්ත්‍රීතුමා අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා සංවර්ධන කාර්යයන් ඉටු කිරීමෙහි ලා සියලු මන්ත්‍රිවරුන්ට සමසේ ප්‍රතිපාදන ලබා දුන් බවත්, ඒ පිළිබඳ සලකා බලන විට අතිගරු ජනාධිපතිතුමා හට කෘතගුණ සැලකීමේ අවශ්‍යතාවයක් තිබෙන බවටත් පවසන ලදී. ජනතාවට සේවය කරමින් සිටින හා සේවයට කිරීමට බලාපොරොත්තුවෙන් සිටින දෙපිරිසක් අතර, පවතින මෙම මැතිවරණය පිළිබඳ බුද්ධිමත් ජනතාව විසින් නිවැරදි තීරණයක් ගනු ඇතැයි තමන් අපේක්ෂා කරන බව පැවසූ ගරු මන්ත්‍රීතුමා සභාපතිතුමා, ගරු මන්ත්‍රීවරුන්, ලේකම්තුමිය, අංශ ප්‍රධානීන් ඇතුළු කාර්ය මණ්ඩලයට ලබන්නා වූ 2015 වසර ප්‍රීතිමත් සුභ නව වසරක් වේවා යි ප්‍රාර්ථනා කරමින් අදහස් දැක්වීම අවසන් කරන ලදී.

## 15. අවසානය

**ගරු සභාපති ඩබ්ලිව්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා**

2014 අවසාන මහ සභා රැස්වීමේ දී විවිධ අදහස් හා සිතුවිලි ප්‍රකාශ කළ ද තමන් හට ඇති එකම සතුට නිදහසේ ජීවත්වීමේ සතුට බව 1995 වසරේ නගර සභාවට පත් වූ කාලයේ තිබූ භීෂණය කිසි

දිනක අමතක නොවන බවත්, 1994 වසරේ රජය පත් කරන විට බළන්ගොඩ නගරය එදා තිබුණු ආකාරය හා වර්තමානයේ නගරය පවතින ආකාරය සංසන්දනය කිරීමේ දී නගරයේ ඇති වී ඇති සංවර්ධනය පිළිබඳ බුද්ධිමත් ජනතාව නිවැරදි තීන්දුවක් ගන්නා බව තමා හට විශ්වාස බවත් ගරු සභාපතිතුමා පවසන ලදී.

පෞද්ගලික ලාභ අපේක්ෂාවෙන් පිල් මාරු වුව ද දශක 30 පැවති යුද්ධය නිමා කිරීමත් සමඟ ඇති වූ සාමය හා සීඝ්‍ර සංවර්ධනය හේතුවෙන් රටේ ජනතාවට බියෙන් සැකෙන් තොර ජීවත්වීමේ අයිතිය සුරැකි අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා තුන්වන වරටත් ජනාධිපති වේවා යි එක සිතින් ප්‍රාර්ථනා කරන බවත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී චමික වැවේගෙදර මැතිතුමා ප්‍රකාශ කළ තානායම ටෙන්ඩර් කිරීමේ යෝජනාවට හා මාර්ග නඩත්තු කම්කරුවන් වැඩි කිරීමේ අදහසට පිළිතුරු දුන් ගරු සභාපතිතුමා තානායම ටෙන්ඩර් කිරීමට පැකිලීමක් නොමැති නමුදු ඉන් නගර සභාවට ලැබෙන යම් වරප්‍රසාද පිළිබඳ අවතක්සේරු කිරීමට නොහැකි හෙයින් තානායම නගර සභාව සතුව පවත්වා ගැනීම වාසි දායක බවටත් කරුණු ගෙන හැර දැක්වීය.

මාර්ග නඩත්තු කම්කරුවන් වැඩි කිරීමේ අදහසට පිළිතුරු දුන් ගරු සභාපතිතුමා මේ වනවිට මාර්ග නඩත්තු කම්කරුවන් 12 දෙනෙකු අවශ්‍ය පරිදි නඩත්තු හා සංවර්ධන කටයුතුවල නිරත වන බවත්, හදිසි ආපදා අවස්ථාවන්හි දී අදාල සේවාවන් සඳහා ඔවුන් යොදවන බවත් වැඩිදුරටත් පවසන ලදී.

ලබන්නා වූ 2015 වර්ෂය පක්ෂ භේදයකින් තොරව හැකි අයුරින් සියලු දෙනාටම උදව් උපකාර කරමින් ද අඩුපාඩු අවම කරගනිමින් ද කටයුතු කිරීමට ඇප කැප වී කටයුතු කරන බව පැවසූ ගරු සභාපතිතුමා අවසාන වශයෙන් අදහස් දක්වමින් මහජනතාවගේ සුභ සිද්ධිය උදෙසා ඔවුන් තෘප්තිමත් වන අයුරින් සහයෝගයෙන් කටයුතු කිරීමට අප සියළු දෙනා කැපවිය යුතු බව දන්වමින් ගරු සභාපතිතුමන් විසින් මහා සභාවේ කටයුතු ප. ව. 2.00 ට අවසන් කරන ලදී.

ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.